# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2396/61 – 2024 අගෝස්තු මස 10 වැනි සෙනසුරාදා – 2024.08.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2022/36.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එල්. ඩී. පී. දිල්රුප්ෂි මිය ඇතුළු නිලධාරීන් 05 දෙනා, කලුහබරල ජනපදය, ඇටඹේ. නාරංගොඩ.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් ( විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කොළඹ 06, පොල්හේන්ගොඩ, එඩ්මන්ටන් නිවාස, XB 10/3, නීතිඥ ඩී. ජී. කේ. කරුණාරත්න මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

මනූෂ නානායක්කාර,
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2024 අගෝස්තු මස 02 වැනි දින,
කොළඹ දීය.

1A – G 042432 – 14 (2024/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/04/2022/36.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එල්. ඩී. පී. දිල්රුප්ෂි මිය ඇතුළු නිලධාරින් 05 දෙනා, කලුහබරල ජනපදය, ඇටඹේ. නාරංගොඩ.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ** –

"ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නීති නිලධාරීන් ලෙස නීති අංශයේ දැනට සේවය කරන එල්. ඩී. පී. දිල්රුප්ෂි මිය, පී. ඒ. ඩී. ඩී. පනංගල මිය, ශානිකා දිලන්ති ගාල්ලගේ මිය, නදීශා ගයත්‍රී සිල්වා අමරතුංග මිය හා දැනට සේවයේ නොමැති පී. එස්. එම්. කේ. රත්නායක මිය යන නිලධාරීන් පස් දෙනා හට,

- ආයතනය තුළ උසස්වීම් හිමි ද, හිමිනම් එය ලබානොදීම
- රාජකාරි කටයුතු සඳහා නිල වාහන හිමි ද, හිමි නම් එය ලබා නොදීම
- වසර 11 ක් ලබා දී ඇති රු. 15,000 ක වෘත්තීය දීමනාව අත්හිටුවීම
- නව සේවක සංයුතිය හා වැටුප් සංශෝධනය තුළින් තබා ඇති වැටුප් තලය

මගින් අසාධාරණයක් සිදුව තිබේ ද, යන්නත්, එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්නත් පිළිබඳව වේ."

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 ජූලි මස 03 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 08 – 0121

---

මගේ අංකය: IR/COM/04/2021/56.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ටී. එස්. රූපසිංහ මයා, 18/B/7, අබේගුණරත්න මාවත, පඹුරන, මාතර.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

රාජ්‍ය දැව සංස්ථාව, අංක 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් ( විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, ගාල්ල, කිතුලම්පිටිය, වේවැල්වල පාර, අංක 10/51. වසන්ත වික්‍රමරත්න පුංචිහේවා මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2024 අගෝස්තු මස 02 වැනි දින,
කොළඹ දීය.

මගේ අංකය: IR/COM/04/2021/56.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ටී. එස්. රූපසිංහ මයා, 18/B/7, අබේගුණරත්න මාවත, පඹුරන, මාතර.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

රාජ්‍ය දැව සංස්ථාව, අංක 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ** –

“රාජ්‍ය දැව සංස්ථාවේ තලල්ල දැව ගබඩාවේ සහකාර ප්‍රාදේශීය කළමනාකරු ලෙස සේවය කළ ටී. එස්. රූපසිංහ මහතාගෙන් 2006 සහ 2007 වර්ෂවලට අදාලව දැව ඌනතා / අතිරික්තතා සඳහා ඔහුගේ වැටුපෙන් සහ ඇප තැන්පතු මුදලෙන් රු, 306,104.75 ක මුදලක් අයකර ගැනීම මගින් ඔහුට අසාධාරණයක් සිදු වී තිබේ ද යන්නත්, එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ.”

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 ජූලි මස 19 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 08 – 0122

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.